# පරිගණක පද්ධති ඒකකය

එන්.පී. විජේරත්න

කම්පියුටරයක් මිලදී ගන්නා අවස්ථාවේදී ම ඒ සඳහා ලබා ගත හැකි සියලු ම අතිරේක උපාංග මිල දී ගන්නේ කලාතුරකින් කෙනෙකි. එබැවින් සෑම පද්ධති ඒකකයක ම පසුව මිලදී ගන්නා උපාංග සවි කිරීම සඳහා අවශ්‍ය ඉඩ වෙන් කර ඇත. ඒ සඳහා වුවමනා කුට් ගැලපෙන පියන් වලින් වසා ඇත.

පරිගණක පද්ධතියක ඇති අතිශයින් ම වැදගත් කොටස වශයෙන් සැලකිය හැක්කේ එහි පද්ධති ඒකකය යි. මෙය සී.පී.යූ. කොන්සෝල්, සිස්ටම් යුනිට් වැනි නම්වලින් හඳුන්වනු ලබයි. මේ සමග ඇති පළමු රූප සටහනේ පද්ධති ඒකකය ඇතුළු සම්පූර්ණ පරිගණක පද්ධතියක් දක්වෙයි.

කම්පියුටරයට අයත් සියලු ම කොටස් සවි කර හෝ ඈඳ ඇත්තේ පද්ධති ඒකකය හෙවත් සිස්ටම් යුනිට් එකට ය. පද්ධති ඒකකයක දකින්නට ලැබෙන විවිධ කොටස් අපි දැන් හඳුනා ගනිමු. මෙම විස්තර මෙහි දෙවෙනියට ඇති පද්ධති ඒකකයේ රූප සටහන සමග සසඳ බලන්න.

**Air Vents :** සෑම පද්ධති ඒකකය ම අනිවාර්යෙන් ම දකින්නට ඇතත් එයා වෙන්ට්ස් හෙවත් පද්ධති ඒකකය තුළට වාතාශ්‍රය ලබා ගැනීම සඳහා ඇති කවුළු බැලූ බැල්මට ම වැදගත් යයි කෙනෙක් නොසිතයි. එහෙත් පද්ධති ඒකකය තුළ ජනිත වන අධික උෂ්ණත්වය තරමක් දුරට හෝ සමනය කිරීමට මෙමගින් ඇතුළට ගන්නා වාතය උපකාරී වෙයි. එබැවින් පද්ධති ඒකකය තබා ගත යුත්තේ එයා වෙන්ට්ස් නොවැසෙන පරිදි ය.

**Floppy Drive** : දත්ත පිටපත් කිරීම සඳහා උපයෝගී කර ගන්නා ප්ලොපි ඩිස්ක හෙවත් නම්‍ය තැටිති ඇතුළු කරන්නේ ප්ලොපි ධාවකයට ය. දැන් භාවිතයේ පවතින පරිගණක වැඩි හරියක ඇත්තේ තනි ප්ලොපි ධාවකයක් වුවත් ඇතැම් ඒවායේ මේවා දෙකක් දකින්නට ඇත. ඩිස්ක් කොපි කිරීමේ දී එය ප්‍රයෝජනවත් ය. වර්තමානයේ වැඩිපුරම භාවිතා වන්නේ මි. මී. 89 ප්‍රමාණයේ ප්ලොපි ඩිස්ක වුවත් මි.මී. 135 ප්‍රමාණයේ ඩිස්ක හා ධාවක ද කලාතුරකින් දැකිය හැකි ය. දත්ත පිටපත් කර තබා ගැනීම සඳහා ප්ලොපි ඩිස්ක භාවිතය කෙමෙන් අභාවයට යමින් පවතී. ඒ වෙනුවට උපයෝගී කර ගන්නේ හාඩ් ඩිස්කය හා වෙනත් ඉවත් කළ හැකි මාධ්‍යයන් ය.

**CD-ROM Drive :** සීඩී ධාවකය නැත්නම් සංයුක්ත තැටි ධාවකය කලින් තිබූ මි.මී. 135 ප්‍රමාණයේ ප්ලොපි ධාවකයකට සමාන ය. සාමාන්‍ය සංයුක්ත තැටියක ප්ලොපි ඩිස්ක 450 ක අල්ලන ප්‍රමාණයට වඩා අධික දත්ත ප්‍රමාණයක් තැන්පත් කළ හැකි ය. විශාල ප්‍රමාණයේ ගොනු (ෆයිල්ස්) හුවමාරුව සඳහා දැන් ප්‍රයෝජනයට ගන්නේ සංයුක්ත තැටි ය.

**Future expansion:** කම්පියුටරයක් මිලදී ගන්නා අවස්ථාවේදී ම ඒ සඳහා ලබා ගත හැකි සියලු ම අතිරේක උපාංග මිල දී ගන්නේ කලාතුරකින් කෙනෙකි. එබැවින් සෑම පද්ධති ඒකකයක ම පසුව මිලදී ගන්නා උපාංග සවි කිරීම සඳහා අවශ්‍ය ඉඩ වෙන් කර ඇත. ඒ සඳහා වුවමනා කුට් ගැලපෙන පියන් වලින් වසා ඇත. දෙවැනි රූප සටහන දෙස විමසිල්ලෙන් බැලීමෙන් එය වටහා ගත හැකි ය. පටි ධාවකයක් (ටේප් බැක්අප් යුනිට්) අතිරේක හාඩ් ඩිස්කයක් මෙන් ම අනාගතයේ දී නිර්මාණය කරනු ලබන වෙනත් කිසියම් උපාංගයක් ද පද්ධති ඒකකයට එක් කිරීම සඳහා මෙම අතිරේක කුට් ප්‍රයෝජනයට ගත හැකි ය.

**Buttons and Lights:** පරිගණකයක පාලනයට උපයෝගී කර ගන්නා බොත්තම් වලින් වැඩිහරියක් ඇත්තේ එහි යතුරු පුවරුව මත ය. එහෙත් අතිශයින් ම වැදගත් බොත්තම් කීපයක් පද්ධති ඒකකය මත දකින්නට ඇත. නූතන පරිගණකවල මෙම බොත්තම් ආකර්ශනීය එල්.ඊ.ඩී. බල්බ් සමග සම්බන්ධ කර ඇත. එම බොත්තම් හා බල්බ්වලට මේවා ද ඇතුළත් වෙයි.

**On-Off Button :** ඔන්-ඕෆ් බොත්තම, පරිගණකයේ ප්‍රධාන බල සැපයුම් ස්විචය මෙය යි. පරිගණකය පණගන්වන්නේ හෙවත් ඔන් කරන්නේ මෙම බොත්තම එබීමෙනි.

1 රූප සටහන



සාමාන්‍යයෙන් පද්ධති ඒකකයේ ඉදිරියේ ඇති ප්‍රමාණයෙන් විශාල ම බොත්තම මෙයයි. සාමාන්‍යයෙන් වෙනත් බොත්තම් ළඟින් තරමක් වෙන් වී පිහිටුවා ඇත. එය රවුම් මෙන් ම රූප සටහනේ මෙන් ඕවලාකාර හෝ දිගටි හැඩයේ එකක් විය හැකි ය. පණ ගන්වා ඇති කම්පියුටරයක් වසා දමන්නේ හෙවත් ඕෆ් කරන්නේ ද මෙම බොත්තම එබීමෙනි. එය සක්‍රියව පවතින බව හැඟවීමට කුඩා බල්බයක් දැක්වෙයි. එය නැතත් පද්ධති ඒකකය තුළින් නැගෙන විවිධ ශබ්ද නිසා කම්පියුටරය පණ ගැන් වී ඇති නැති බව දැන ගත හැකි ය.

Reset Button : ප්‍රති සැකසුම් බොත්තම, පරිගණකයක් නැවත වරක් ඕන් හා ඔෆ් කිරීමකින් තොරව ප්‍රතිපණ ගැන්වීමට රිසෙට් බොත්තම යොදා ගනී. කම්පියුටරයේ යතුරු පුවරුව හා මවුසය අක්‍රියව වී කිසිම විධානයක් දිය නොහැකි තත්ත්වයකට පත්ව ඇති විට එය ප්‍රතිපණ ගැන්වීම සඳහා උපයෝගී කර ගන්නේ රිසෙට් බොත්තම ය.

Tubo Button : ටර්බෝ බොත්තම, වත්මන් පරිගණක සඳහා කිසිම ප්‍රයෝජනයක් නැති බොත්තමකි. ඇතැම් පද්ධති ඒකකවල මෙම බොත්තම දකින්නට නැත. උපරිම වේගයෙන් ක්‍රියාත්මක වෙන පරිගණකයක දී ටර්බෝ බොත්තම එබූ විට වේගය පාලනය වෙයි. එනම් අඩු වේගයකින් ධාවනය වෙයි. එසේ කිරීම අවශ්‍ය වන්නේ අධික වේගයකින් ධාවනය කරවිය නොහැකි පැරණි මුද්‍රකාංග සඳහා පමණ ය.

පරිගණකයක් මිලදී ගන්නා හැම අයෙක් ම අපේක්ෂා කරන්නේ තම කාර්යයන් හැකි උපරිම වේගයකින් ඉටු කර ගැනීමට ය.

එබැවින් හෙමින් ධාවනය කරවීමට අවශ්‍ය වන්නේ කලාතුරකින් කෙනෙකුට ය. ටර්බෝ යන වචනයෙන් නොමග නොයා යුතු ය. එය එබූ විට කම්පියුටරය ක්‍රියාත්මක වන්නේ හෙමිනි.

Hard Drive Light : හාඩ් ඩිස්ක් බල්බය. හාඩ් ඩිස්කය ක්‍රියාත්මකව පවතින විට මෙම බල්බය ද පත්තු වෙයි.




**2 රූප සටහන**

ඔන්-ඕෆ් බොත්තම, පරිගණකයේ ප්‍රධාන බල සැපයුම් ස්විචය මෙය යි. පරිගණකය පණගන්වන්නේ හෙවත් ඔන් කරන්නේ මෙම බොත්තම එබීමෙනි. සාමාන්‍යයෙන් පද්ධති ඒකකයේ ඉදිරියේ ඇති ප්‍රමාණයෙන් විශාල ම බොත්තම ය. සාමාන්‍යයෙන් වෙනත් බොත්තම් ළඟින් තරමක් වෙන් වී පිහිටුවා ඇත.

පද්ධති ඒකකය ඇතුලේ ඇති හාඩ් ඩිස්කය අපට දැක ගත නොහැකි නියා එය ක්‍රියාත්මකව පවතින හෝ නොමැති බව අපට දැන ගත හැක්කේ මෙම බොත්තම මගිනි.

පද්ධති ඒකකය පසුපස විවිධ මාදිලියේ සොකට් වර්ග පවතී. මෙහි ඇති තුන්වෙනි රූප සටහනේ ඒවා සියල්ලම පාහේ පෙන්වා ඇත. දක්වා ඇති විස්තර එම රූප සටහන සමග සසඳා අදාළ කෙවෙනි හඳුනා ගන්න.

Power = විදුලිය සපයන කෙවෙනිය (සොකට් එක)

Mouse = මවුසය සවිකරන කෙවෙනිය

Keyboard =යතුරු පුවරුව සවිකරන කෙවෙනිය

USB ports =යූ.එස්.බී. (යුනිවර්සල් සීරියල් බස්) කෙවෙනි

Serial post CoM 1 =කොම් 1 සංනිවේදන කෙවෙනිය. සීරියල් (ශ්‍රේණිගත) කෙවෙනියකි. සංනිවේදන උපකරණ සවිකරන්නේ මේවාට ය.

Printer port = මුද්‍රකය සවි කරන කෙවෙනිය

Serial port COM 2=කොම් 2 සංනිවේදන කෙවෙනිය.

Speakers = ස්පීකර්ස් (ශබ්ද වාහිනී) සවිකරන කෙවෙනිය

Sound line in =වෙනත් උපකරණ මගින් ජනිත කරන නාද සංඥා පරිගණකයට එක් කිරීම සඳහා අදාළ ප්ලග් එක සවි කරන කෙවෙනිය

Mic in = මයික්‍රෝපෝනය

Video conectors for DVD output =වීඩියෝ සම්බන්ධක, මේවා ඩී වී ඩී ධාවකය සඳහා උපයෝගී කර ගනී

Air intake =වාතය ඇතුළට ඇද ගන්නා කවුළු

Fan = විදුලි පංකාව

Joystick = පරිගණක ක්‍රීඩා හැසිර වීම සඳහා භාවිත කරන ජෝයිස්ටික් සවි කරන කෙවෙනිය

Expansion slots =පසුව අතිරේක කාඩ් පත් සවි කිරීම සඳහා ඇති කෙවෙනි. මේවා කීපයක් ම ඇත

Video (VGA) connecter =වීඩියෝ කනෙක්ටරය, මොනිටර් කේබලය සවි කරන්නේ මෙතැනට ය.

Modem =මොඩමය. පරිගණකය දුරකථන මාර්ගයකට සම්බන්ධ කරන්නේ මෙතැනිනි.

## ඩිස්ක ඩ්‍රයිව්ස් හෙවත් ඩිස්ක ධාවක යනු කුමක් ද?

පරිගණක උපදෙස්වල දී නිතරම A : ධාවකය ගැන සඳහන් වෙයි. මෙයින් හැඳින්වෙන්නේ ඔබේ පරිගණකයේ ඇති ප්ලොපි ඩිස්කට් (නම්‍ය තැටිති) ධාවකය යි. බොහෝ පරිගණකවල ඇති එක ම ප්ලොපි ධාවකය මෙය යි. ඔබේ පරිගණකයේ ප්ලොපි ධාවක දෙකක් ඇත්නම් සාමාන්‍යයෙන් A : ධාවකය වන්නේ එහි ඉහළින් පිහිටි එක ය.

පරිගණකයක ඇති පළමුවෙනි හාඩ් ඩිස්කය හැඳින්වෙන්නේ C: ධාවකය හෙවත් ඩ්‍රයිව් සී වශයෙනි. ඔබේ පරිගණකයේ හාඩ් ඩිස්කය කොටස්වලට බෙදා (පාටිශන් කර) ඇත්නම් හෝ අතිරේක හාඩ් ඩිස්ක සවි කර ඇත්නම් එම කොටස් හෝ හාඩ් ඩිස්ක පිළිවෙළින් D, E, F ධාවක වශයෙන් හැඳින්වෙයි.

## අතිරේක උපදෙස්

ඕන්/ඔෆ් ස්විචයක් ඇති එක ම උපාංග පද්ධති ඒකකය පමණක් නොවේ. මොනිටරය, ප්‍රින්ටරය, මොඩමය හා වෙනත් බාහිර උපකරණ බොහොමයක ඒවාට ම ආවේණික ඕන්/ඔෆ් ස්විච ඇත.

පද්ධති ඒකකයේ ඇති වා කවුළු ආවරණය වන පරිදි කිසිවක් ම නොතැබිය යුතු ය. එසේ කළහොත් පද්ධති ඒකකයේ අභ්‍යන්තර වුවමනාවට වැඩියෙන් රත් වෙනු ඇත. එය අතිශයින් ම හානිකර ය.

හාඩ් ඩිස්කය හඳුන්වන බල්බය (එල්.ඊ.ඩී.එක) රතු, කොළ හෝ කහ

පැහැ විය හැකි ය. හාඩ් ඩිස්කය ක්‍රියාත්මකව පවතින විට එය නිවී පත්තු වෙයි. ඔබ ඒ ගැන තැකීමක් කළ යුතු නැත. මෙය අනතුරු සංඥාවක් නොවේ. හාඩ් ඩිස්කය දත්ත කියවන හෝ ලියා ගන්නා බව පෙන්වීමක් පමණ ය.

කම්පියුටරයක ප්‍රධාන ස්විචයේ On/Offයන වචන දෙක දැක ගැනීමට කලබල නොවිය යුතු ය. එසේ වචනයෙන් සඳහන් කර ඇති පද්ධති ඒකක ඇත්තේ ම නැති තරම් ය. සාමාන්‍යයෙන් ස්විචයේ ඕන් වෙන පැත්තේ සිරස් ඉරි කැබැල්ලක් ද ඕෆ් වෙන පැත්තේ රවුමක් ද දකින්නට ලැබෙයි. ටොගල් හෙවත් වරක් එබූ විට ඕන් වන හා යළිත් එබූ විට ඕෆ් වන ස්විචයක කිසිම සඳහනක් නොතිබිය හැකි ය. මෙය සාමාන්‍යයෙන් පද්ධති ඒකකයේ ඇති ප්‍රමාණයෙන් විශාල ම ස්විචය බැවින් හඳුනා ගැනීම පහසු ය.

## විවිධ පරිගණක වර්ග

දැනට භාවිතයේ පවතින හැම පරිගණකයක් ම මෙහි ඇති රූපසටහන්වලට සමාන ආකාරයේ ම පද්ධති ඒකක වලින් සමන්විත ඒවා නොවේ. විවිධාකාරයට සැලසුම් කරන ලද පද්ධති ඒකක වෙළෙඳ පොළේ පවතී. දැනට ලබා ගත හැකි විවිධ මාදිලියේ පරිගණක මෝස්තර හඳුන්වන පද මේවා ය.

Desktop =තිරස් අතට පිහිටි, එනම් ගැඹුරු හා පළල, එහෙත් උසින් අඩු පද්ධති ඒකක සහිත පරිගණක හඳුන්වන නමයි. මුල් අවධියේ තිබුණේ මේ වර්ගයේ පද්ධති ඒකක පමණ ය. මේසයක් මත පහසුවෙන් රැඳවිය හැකි අතර මොනිටරය පද්ධති ඒකකය මත තබා ගත හැකි නිසා වැය වන්නේ අඩු ඉඩ ප්‍රමාණයකි. පසුව ඩෙස්ක්ටොප් ස්මෝල් ෆුට්ප්‍රින්ට් නමින් හඳුන්වනු ලැබූ ප්‍රමාණයෙන් තරමක් කුඩා පද්ධති ඒකක ද හඳුන්වා දෙනු ලැබිණ. එහෙත් අභ්‍යන්තරය ඉඩ අතිශයින් ම සීමිත වීම නිසා ඒවා අර තරම් ම ජනප්‍රිය වූයේ නැත.

Laptop =ලැප්ටොප්, කුඩා පරිගණක විශේෂයකි. උකුළ මත තබා ගෙන වැඩ කළ හැකි නිසා නිතර ගමනේ යෙදෙන ව්‍යාපාරිකයන් වැනි අය අතර ජනප්‍රිය යි. සාමාන්‍ය ඩෙස්ක්ටොප් කම්පියුටරයකින් කළ හැකි හැම වැඩක් ම මේවායින් ද කළ හැකි ය. මිල තරමක් අධික ය.

Notebooks = නෝට්බුක්ස්, ලැප්ටොප්ස් හෙවත් උකුළ මත තබා ගෙන වැඩ කළ හැකි පරිගණකයක් රාත්තල් පහක් හයක් පමණ බර නිසා නිතර ම ගමනේ යෙදෙන අයට ඒ මේ අත රැගෙන යාම තරමක් දුෂ්කර ය. එබැවින් බරින් අඩු, ප්‍රමාණයෙන් කුඩා, එහෙත් වඩාත් වේගවත් පරිගණක විශේෂයක් පසුව හඳුන්වා දෙන ලදී. ඒවා හඳුන්වන්නේ නෝට්බුක් කම්පියුටර් යන නමිනි. ප්‍රමාණයේ මිස බාහිර පෙනුමේ ලැප්ටොප් කම්පියුටර් වලට වඩා සැලකිය යුතු වෙනසක් නැත.

Towers =ටවර්, මොනිටරයට පැත්තකින් කුලුණක් මෙන් නැගී සිටින පද්ධති ඒකක සහිත පරිගණක හැඳින්වූයේ මේ නමිනි. ප්‍රමාණයෙන් තරමක් විශාල ය. වර්තමානයේ වැඩි වශයෙන් භාවිතා වන්නේ පරිගණක ජාලවල සර්වරයක් වශයෙනි.

Mini-tower = වර්තමානයේ අලෙවි කරන පරිගණක වලින් වැඩි ප්‍රමාණයක් මෙම වර්ගයේ ඒවා ය. සිරස් අතට තබන පද්ධති ඒකකයකින් සමන්විත ය. ඩෙස්ක්ටොප් සිස්ටම් යුනිට් වලට වඩා වැඩි ඉඩක් අවශ්‍ය නමුත් එහි ඇති ආකර්ශනීය පෙනුම නිසා වැඩි දෙනෙක් කැමැත්තක් දක්වයි.




3 රූප සටහන

## මූලික මෘදුකාංග

කම්පියුටරයකින් අප අපේක්ෂා කරන කාර්යයන් ඉටු කර ගත හැක්කේ මෘදුකාංග හෙවත් සොෆ්ට්වෙයා යන නමින් හඳුන්වන උපදෙස් මාලා නිසා ය. ඩිස්කයක චුම්බක රටා මගින් තැන්පත් කර ඇති නිසා අපට මෘදුකාංග දැකිය නොහැකි ය. එහෙත් පරිගණකයේ දෘඩාංග හෙවත් හාඩ්වෙයා වලට ඒවා කියවා වටහා ගෙන ඒ අනුව කටයුතු කළ හැකි ය. විධිමත්ව සකස් කළ මෘදුකාංග නැත්නම් විශාල වියදමක් දරා නිපදවනු ලබන පරිගණකයකින් පවා කිසිම මෙහෙයක් ඉටු කර ගත නොහැකි ය.

ඉතාමත් වැදගත් මෘදුකාංගය වන්නේ කම්පියුටරයේ ඔපරේටිං සිස්ටම් හෙවත් මෙහෙයුම් පද්ධතිය යි. පරිගණකය පාලනය කරන්නේ, මෙහෙය වන්නේ, කෙරෙන සෑම කාර්යයක් ම විධිමත්ව හා පිළිවෙළකට සිදුවීමට සලස්වන්නේ මෙම මෙහෙයුම් පද්ධතිය මගිනි. පරිගණකයක ජීව වායුව එයයි. පරිගණකය සෑදී ඇති දෘඩාංග පමණක් නොව එමගින් විවිධ කාර්යයන් ඉටු කර ගැනීමට යොදා ගන්නා භාවිත මෘදුකාංග හෙවත් ඇප්ලිකේශන් සොෆ්ට්වෙයා නිසි පරිදි මෙහෙයවන්නේ ද මෙහෙයුම් පද්ධතිය මගිනි.

දැනට ඇති අතිශයින් ම ජනප්‍රිය මෙහෙයුම් පද්ධතිය මයික්‍රෝසොෆ්ට් ය. ඔබ සතු පරිගණකයේ වින්ඩෝස්වල කිසියම් සංස්කරණයක් තිබිය යුතු ය. සාමාන්‍යයෙන් වින්ඩෝස් 95, වින්ඩෝස් 98, වින්ඩෝස් 98 දෙවෙනි සංස්කරණය, වින්ඩෝස් 2000, වින්ඩෝස් මිලේනියම් සංස්කරණය හා අලුතින්ම හඳුන්වා දුන් වින්ඩෝස් එක්ස් පී. දැනට භාවිතයේ පවතින වින්ඩෝස් මෙහෙයුම් පද්ධති අතර වෙයි. කෙසේ වෙතත් ඇපල් සිස්ටම් නමින් හඳුන්වන තවත් මෙහෙයුම් පද්ධතියක් ද ඇත. ඒවා වැඩිවශයෙන් භාවිතයට ගන්නේ මැකින්ටෝෂ් කම්පියුටර් සඳහා ය. එහි නවතම සංස්කරණය සිස්ටම් ටෙන් ය. එමෙන් ම ෂෙනික්ස්, යුනික්ස්, ලිනක්ස් වැනි තවත්මෙහෙයුම් පද්ධති කීපයක් ද පවතින නමුත් ඒවා භාවිත කරන්නේ සීමිත පිරිසක් පමණ ය.


සාමාන්‍යයෙන් වින්ඩෝස් 95, වින්ඩෝස් 98, වින්ඩෝස් 98 දෙවෙනි සංස්කරණය, වින්ඩෝස් 2000, වින්ඩෝස් මිලේනියම් සංස්කරණය හා අලුතින්ම හඳුන්වා දුන් වින්ඩෝස් එක්ස් පී. දැනට භාවිතයේ පවතින වින්ඩෝස් මෙහෙයුම් පද්ධති අතර වෙයි. කෙසේ වෙතත් ඇපල් සිස්ටම් නමින් හඳුන්වන තවත් මෙහෙයුම් පද්ධතියක් ද ඇත.


## මතක තබා ගන්න

* කම්පියුටරයක ඇති අතිශයින්ම වැදගත් මෘදුකාංගය එහි මෙහෙයුම් පද්ධතියයි.

67 පිටුවට

# පරිගණක පද්ධති...

45 පිටුවෙන්

සාමාන්‍යයෙන් ඔබ පරිගණකයක් මිලදී ගන්නා අවස්ථාවේ දී ම එහි මෙහෙයුම් පද්ධතිය පිහිටුවා ඇත. එබැවින් ඔබට දෙවෙනි මෙහෙයුම් පද්ධතියක් මිලදී ගැනීමට සිදුවන්නේ කලාතුරකින් අවස්ථාවක දී ය.

මුල් යුගයේ දී ඔබට විශේෂිත පරිගණකයක් සඳහා ගැලපෙන මෘදුකාංග ක්‍රමලේඛ (සොෆ්ට්වෙයා ප්‍රෝග්‍රෑම්ස්) සොයා ගැනීමට සිදු විය. ඒ අවදියේ මෘදුකාංග අලෙවි සැල්වල අයි.බී.එම්., ඇපල්, කොමඩෝර් වැනි පරිගණක සඳහා වෙන වෙනම අංශ පිහිටුවා තිබින. දැන් පරිගණකයේ වර්ගය හා මාදිලිය කුමක් වුවත් භාවිත මෘදුකාංග තෝරාගැනීමේදී එහි ඇති මෙහෙයුම් පද්ධතියට අනුව එනම්, වැන්ඩෝල්, මැකින්ටෝෂ් හෝ ඕ.එස් /2 වැනි මෙහෙයුම් පද්ධතිවලට අනුව මෘදුකාංග තෝරා ගත හැකි ය.

පුද්ගල පරිගණක සඳහා මුල් යුගයේ තිබූ ජනප්‍රියම මෙහෙයුම් පද්ධතියDOS ය. අද එම තැන මයික්‍රෝසොෆ්ට් වින්ඩෝස් විසින් හිමි කර ගෙන ඇත. වරින් වර මතුවෙන නව මෙහෙයුම් පද්ධතිවලට එය යටපත් කිරීමට නොහැකි වී ඇත.

## වෙනත් ක්‍රමලේඛ වර්ග

මෙහෙයුම් පද්ධතිය මගින් කෙරෙන්නේ පරිගණකයේ පාලනය පමණ ය. ඔබට ප්‍රයෝජනවත් වෙනත් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ඇප්ලිකේශන් සොෆ්ට්වෙයා හෙවත් භාවිත මෘදුකාංග අවශ්‍ය ය. සරල ලිපියක් සැකසීමේ සිට සංකීර්ණ රූපයක් නිර්මාණය කර ගැනීම දක්වා විවිධ ආකාරයේ කාර්යයන් පහසුවෙන් ඉටුකර ගත හැකි භාවිත ක්‍රමලේඛ දස දහස් ගණනක් වෙළෙඳ පොළේ ඇත. එයට පද සකසන (වර්ඩ් ප්‍රොසෙසර්ස්), පැතුරුම්පත් (ස්ප්‍රෙඩ් ෂීට්ස්, දත්ත පදනම් (ඩේටා බේසස්) වැනි නිතර භාවිතයට ගැනෙන අවශ්‍යතා මෙන්ම ගෘහ හා ඉංජිනේරුමය නිර්මාණ ආදිය ද සකස් කර ගත හැකි ක්‍රමලේඛ ඇතුළත් ය.

ලබා ගත හැකි වෙනත් ක්‍රමලේඛ අතර යුටිලිටීස් හෙවත් උපයෝගී යෙදුම්, පරිගණක ක්‍රීඩා, අධ්‍යාපනික වැඩසටහන් මෙන්ම පරිගණකය මගින් නව ක්‍රමලේඛ නිර්මාණය කර ගත හැකි ක්‍රමලේඛ ද දකින්නට ඇත. මේවා ගැන සම්පූර්ණ විස්තර ඉදිරි පාඩමකින් පැහැදිලි කරන්නෙමු.

පරිගණක භාවිත යෙදුම අතර අතිශයින් ම ජනප්‍රිය ක්‍රමලේඛ අතරට ඉන්ටර්නෙට් පිරික්සුම් ක්‍රමලේඛ ද එක්වෙයි. එමෙන් ම මාර්ගගත (ඔන්ලයින්) සන්නිවේදන කටයුතු ඉටු කර ගත හැකි ක්‍රමලේඛ ද ජනප්‍රියයි. මේවා ගැන ඉදිරියේ දී උගත හැකි ය.

යුටිලිටීස් (උපයෝගිතා) යන නමින් හඳුන්වන්නේ කිසියම් විශේෂිත කාර්යයක් පමණක් ඉටු කර දෙන ක්‍රමලේඛ ය. ඒවා විශේෂයෙන් ම මෙහෙයුම් පද්ධතියේ කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට උපකාරී වෙයි. අතිශයින් ම ජනප්‍රිය පරිගණක ක්‍රීඩා ගැන පරිගණක පරිහරණය කරන කුඩා ළමුන් පවා හොඳකාරව දනී.

අධ්‍යාපනික වැඩසටහන් යනු කුඩා ළමුන්ට ගණන් කිරීම උගන්වන ක්‍රමලේඛ පමණක්ම නොවේ. ඔබට පරිගණකයක් නිවැරදිව පරිහරණය කිරීම, විධිමත්ව යතුරුපුවරුව හැසිරවීම ආදියේ සිට විවිධ විද්‍යා විෂයයන් හා කාණ්ඩ තිහ හතළිහකින් සමන්විත විශ්වකෝෂ ආදිය ඇතුළත් වැඩසටහන් ඒ අතර දැක ගත හැකි ය.

පරිගණකයක් පරිහරණය කිරීමේදී ඔබ තුළ කිසිසේත්ම චකිතයක් ඇති නොවිය යුතු ය. පරිගණකය නිසා ඔබට හානි සිදුවන්නේ නැත. ස්ටාර් ට්‍රෙක්වල මිස්ටර් ස්පොක් කරන්නාක් මෙන් පරිගණකයක කිසියම් බොත්තමක් ද තද කල විට මුළු ලෝකයම විනාශවෙන සිදුවීම් ඇත්තේ විද්‍යා ප්‍රබන්ධවල පමණ ය. සත්‍ය ලොක්යේ දී එවැන්නක් සිදුවෙන්නේ නැත. ඔබට විධිමත්ව පරිගණකයක් පරිහරණය කළ හැකි ආකාරය මීළඟ පාඩමේ සිට අදියරෙන් අදියර පැහැදිලි කර දෙන්නෙමු. ❑